# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2336/57 - 2023 ජුනි මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2023.06.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 8(එ) 5 වගන්තිය යටතේ සංවර්ධන බලපත්‍ර සඳහා වන අභියාචනා කමිටුව සහ ලේකම් කාර්යාලය පිහිටුවීම සඳහා වන දැන්වීම

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා හට, 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතින් සංශෝධිත, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 8(එ) 5 වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, උක්ත පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව නාගරික සංවර්ධන ප්‍රදේශ ලෙස නම් කරන ලද ප්‍රදේශවල සංවර්ධන බලපත්‍ර ලබා දීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් අගතියට පත් තැනැත්තන් විසින් අමාත්‍යවරයා වෙත සිදු කරන ලද අභියාචනා සලකා බැලීම සඳහා අභියාචනා කමිටුව නමින් ඒකකයක් (මින් මතුවට සංවර්ධන බලපත්‍ර සඳහා වන අභියාචනා කමිටුව) පිහිටුවන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහජනතාවට මෙසේ දැනුම් දෙමි.

(අ) සංශෝධිත පරිදි වූ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ සකසන ලද රෙගුලාසිවලට යටත්ව සංවර්ධන බලපත්‍ර සම්බන්ධයෙන් වන අභියාචනා සඳහා අවසන් තීරණය ලබා දීම.

(ආ) සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම සඳහා වූ අභියාචනා කමිටුවේ රාජකාරී සහ කාර්යයන් ඉටු කිරීම සඳහා පහත සඳහන් සාමාජිකයන් පත් කිරීම.

- (i) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් (සභාපති)
- (ii) සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය
- (iii) සභාපති, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
- (iv) විෂයභාර ගරු අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෙකු
- (v) අධ්‍යක්ෂ ජනරාල්, නාගරික සංවර්ධන අධිකාරිය
- (vi) අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, නාගරික සංවර්ධන අධිකාරිය

(ඇ) සංවර්ධන බලපත්‍ර සඳහා වන අභියාචනා කමිටුවේ අවශ්‍යතාවය පරිදි නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම් කළාප 1) හෝ ඔහු විසින් නම්කරන ලද නිළධාරියකු, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැළසුම් කළාප 2) හෝ ඔහු විසින් නම්කරන ලද නිළධාරියකු, අදාළ අධ්‍යක්ෂක හෝ නිළධාරියකු කැඳවීම.

(ඈ) නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති යටතේ අභියාචනා කමිටුව සඳහා ලේකම් කාර්යාලයක් පිහිටුවනු ලබන අතර, එමගින් ප්‍රධාන සැලසුම් කමිටුව මගින් ප්‍රතික්ෂේප කරන ලදුව අමාත්‍යවරයා වෙත අභියාචනා කරනු ලබන ගැටලු සඳහා අදාල ලිපි ගොනු සකස් කිරීම සහ භෞතිකව සාදා ඇති පරිදි අදින ලද ගොඩනැගිලි සැලැස්මට අදාළ දඩ මුදල ගණනය කිරීම සහ එම ගොනු අභියාචනා කමිටුව වෙත යොමු කිරීම.

(ඉ) සංවර්ධන බලපත්‍ර සඳහා වන අභියාචනා කමිටුවේ නිර්දේශය අවසන් අනුමැතිය සඳහා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම.

(ඊ) අමාත්‍යවරයාගේ අවසාන තීරණය ලැබීමෙන් පසු, අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද සංවර්ධන කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිගේ අත්සනින්, සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම.

(උ) මසකට අභියාචනා කමිටු දෙකක් පවත්වා එක් කමිටුවකට අවම වශයෙන් ලිපිගොනු දෙකක් සාකච්ඡාවට ගැනීම.

(ඌ) අනුමත නොකළ ඉදිකිරීම් නියාමනය කිරීමේදී සංවර්ධන බලපත්‍ර සඳහා වන අභියාචනා කමිටුව විසින් පහත මාර්ගෝපදේශ අනුගමනය කිරීම.

(i) අනුමැතිය ලබාදීමේදී පහත සඳහන් පරිදි දණ්ඩන අගයන් ගණනය කළ යුතු ය.

| *වෙනස් වීම* | *දඩ මුදල්* |
|---|---|
| රෙගුලාසිවලට අනුකූලව වාහන නැවැත්වීමේ පහසුකම් සපයා නොමැති වීම | ආවරණ අනුමැතිය සඳහා අදාල ගණනයන් සේවා ගාස්තු ලෙස අය කිරීම (2021.07.08 දින අංක 2235/54 දරන අති විශෙෂ ගැසට් නිවේදනය ප්‍රකාරව) |
| ගෙබිම් ආවරණ අනුපාතය ඉක්මවීම | අනුමත වර්ෂයේ ඇස්තමේන්තුගත ඉදිකිරීම් පිරිවැයෙන් 50%ක් |
| බිම් ආවරණය ඉක්මවීම | අනුමත වර්ෂයේ පර්චසයේ වටිනාකමින් 75% ක් |

(ii) සම්පූර්ණ අනුමත කිරීමේ ක්‍රියාවලිය සඳහා ඉදිකිරීම් කාලය තුළ, දැනට පවතින හෝ පෙර පැවති රෙගුලාසිය, ප්‍රදේශයට අදාල වන රෙගුලාසිය ලෙස සැලකීම.

(iii) පාර්ලිමේන්තු කලාපය සඳහා වූ සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි (කලාප 1 සහ 2 සඳහා පමණක්), නිදහස් චතුරස්‍ර සහ ආශ්‍රිත ප්‍රදේශය සඳහා වූ සංවර්ධන නියාමන සැලැස්ම සහ රටෙහි වෙනත් ඕනෑම විශේෂ සැලකිල්ලක් දැක්විය යුතු බවට නම් කරන ලද ප්‍රදේශ තුළ රෙගුලාසි උල්ලංඝනය කරනු ලැබූ කිසිදු ඉදිකිරීමක් සම්බන්ධව අභියාචනා කමිටුව නොසැලකිය යුතුය.

(iv) මෙම ගැසට් පත්‍රය පළකරන දිනෙන් පසු කොළඹ සංවර්ධන සැලැස්මේ විශේෂ ප්‍රාථමික නේවාසික කලාපය තුළ රෙගුලාසි උල්ලංඝනය කරනු ලබන කිසිදු ඉදිකිරීමක් සම්බන්ධව අභියාචනා කමිටුව නොසැලකිය යුතුය.

**ප්‍රසන්න රණතුංග** (පා.ම.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2023 ජුනි මස 15 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 වන සහ 18 වන මහල, "සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

EOG 06 - 0110

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.